අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2022

General Certificate of Education (Adv.Level) Examination, 2022

ආර්ථික විද්‍යාව - I කොටස/පැය දෙකයි

Econoics I / Two hours

---

**උපදෙස්,**

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- 1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2),(3),(4),(5) යන පිළිතුරු වලින් නිවැරදි හෝ ඉතාමාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න, එය උත්තර පත්‍රයේ පිටුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (X) යොදා දක්වන්න.

---

1. ආර්ථික විද්‍යාවේ කේන්ද්‍රීය ප්‍රශ්නය වනුයේ
   (1) සාධාරණ බදු ක්‍රමයක් ස්ථාපිත කරගැනීම ය.
   (2) සැම පුරවැසියෙක් සඳහාම අවම ආදායමක් සහතික කිරීමය.
   (3) වුවමනා තෘප්තිමත් කරලීම සඳහා හිඟ නිෂ්පාදන සම්පත් බෙදා වෙන්කර දීම ය.
   (4) සම්පත් අධි උපයෝජනය වීම වළක්වා ගනු පිණිස නීති පද්ධතියක් පනවා ගැනීම ය.
   (5) සම්පත් නාස්ති නොකරමින් භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම ය.

2. නිෂ්පාදන හැකියා වක්‍රය පිටතට හෝ දකුණු පසට හෝ විතැන්වීමකට හේතු වනුයේ පහත සඳහන් කවරක්ද?
   (1) විරැකියාව ඉහළ යාමක්
   (2) උද්ධමනය ඉහළ යාමක්
   (3) ප්‍රාග්ධන තොගයේ ඉහළ යාමක්
   (4) ස්වභාවික සම්පත්වල අඩු වීමක්
   (5) සේවක සංඛ්‍යාවේ අඩු වීමක්

3. පහත සඳහන් දෑ අතුරින් නිෂ්පාදන හැකියා වක්‍ර යොදා ගනිමින් පෙන්නුම් කළ නොහැකි වනුයේ
   (1) පාරිභෝගික ඉල්ලුම ය.
   (2) විභව නිමැවුම ය.
   (3) ආර්ථික වෘද්ධිය ය.
   (4) ආවස්ථික පිරිවැය ය.
   (5) විරැකියාව ය.

4. සමාජ වෙළෙඳපොළ ආර්ථිකයක ලක්ෂණයක් වන්නේ පහත සඳහන් කවරක්ද?
   (1) සියලු සම්පත්වල පෞද්ගලික හිමිකාරිත්වය
   (2) සියලු සම්පත්වල පොදු හිමිකාරිත්වය
   (3) මිල ක්‍රමයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ නියාමන රාමුවක් නොතිබීම
   (4) සුබසාධන සේවා සැපයීමේ දී රජයේ කාර්යභාරය ප්‍රබල වීම
   (5) මූලික ආර්ථික ප්‍රශ්න විසඳා ගැනීමට මධ්‍යගත සැලසුම්කරණය භාවිත කිරීම

Econvideoclz.lk

5. පසුගිය වර්ෂයේ දී ටොන් එකක් රු. 30 000 බැගින් බඩ ඉරිඟු ටොන් මිලියන 15ක් අලෙවි කළ අතර, මෙම වර්ෂයේ දී බඩ ඉරිඟු ටොන් මිලියන 15ක් අලෙවි කරනු ලැබුවේ ටොන් එකක් රු. 25 000කට ය. මෙම ප්‍රතිඵලයට හේතු විය හැක්කේ ඉල්ලුමේ හා සැපයුමේ පහත සඳහන් කවර වෙනස්වීමක්ද?

| | ඉල්ලුම | සැපයුම |
|---|---|---|
| (1) | වැඩිවීම | වැඩිවීම |
| (2) | වැඩිවීම | අඩු වීම |
| (3) | අඩු වීම | වැඩිවීම |
| (4) | අඩු වීම | අඩු වීම |
| (5) | වැඩිවීම | වෙනස් නොවීම |

6. පාරිභෝගිකයෙකු තම මුළු ආදායම X සහ Y යන භාණ්ඩ දෙක මිල දී ගැනීම සඳහා වැය කරනවා යැයි සලකන්න. අනෙකුත් කරුණු නොවෙනස් ව තිබිය දී පාරිභෝගිකයාගේ ආදායමත් X සහ Y භාණ්ඩවල මිලත් දෙගුණ වුවහොත් මෙම පාරිභෝගිකයා

(1) X සහ Y භාණ්ඩ වලින් මිල දී ගන්නා ප්‍රමාණ දෙගුණ කරයි.

(2) X භාණ්ඩය මිල දී ගන්නා ප්‍රමාණය වැඩිකොට Y භාණ්ඩයෙන් මිල දී ගන්නා ප්‍රමාණය අඩු කරයි.

(3) X භාණ්ඩය මිල දී ගන්නා ප්රමාණය අඩු කොට Y භාණ්ඩය මිල දී ගන්නා ප්‍රමාණය වැඩි කරයි.

(4) X සහ Y භාණ්ඩ දෙකම මිල දී ගන්නා ප්‍රමාණය අඩු කරයි.

(5) පෙරදී මිල දී ගත් X සහ Y භාණ්ඩ ප්‍රමාණය ම මිල දී ගනී.

7. බාල භාණ්ඩයක් සඳහා ඇති ඉල්ලුම් වක්‍රය පහළට බෑවුම් වන්නේ ඇයි ද යන්න පැහැදිලි කිරීමෙහි ලා උපකාරි වනුයේ පහත සඳහන් කවරක් ද?

(1) ආදායම් සහ ආදේශන ප්‍රතිවිපාක විසින් ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය එකම දිශාවට රැගෙන යනු ලැබේ.

(2) ආදේශන ප්‍රතිවිපාකය ආදායම් ප්‍රතිවිපාකයට සමාන වේ.

(3) සෘණ ආදායම් ප්‍රතිවිපාකය විසින් ආදේශන ප්‍රතිවිපාකය අභිබවා යනු ලැබේ.


(4) ආදේශන ප්‍රතිවිපාකය විසින් සෘණ ආදායම් ප්‍රතිවිපාකය අභිබවා යනු ලැබේ.

(5) ආදායම ඉහළ යාමත් සමග පාරිභෝගිකයා විසින් භාණ්ඩය පරිභෝජනය කිරීම වැඩි කරනු ලැබේ.

8. X සහ Y භාණ්ඩ අනුපූරක භාණ්ඩ බව සලකන්න. අනෙකුත් කරුණු නොවෙනස් ව තිබිය දී Y භාණ්ඩයේ සැපයුම වැඩි වීමක් නිසා X භාණ්ඩයේ සමතුලිත මිල සහ ප්‍රමාණය මත කවර බලපෑමක් ඇති කෙරේ ද?

| | X භාණ්ඩයේ සමතුලිත මිල | X භාණ්ඩයේ සමතුලිත ප්‍රමාණය |
|---|---|---|
| (1) | අඩු වේ | අඩු වේ |
| (2) | අඩු වේ | වැඩි වේ |
| (3) | වැඩි වේ | අඩු වේ |
| (4) | වැඩි වේ | වැඩි වේ |
| (5) | අඩු වේ | නොවෙනස් වේ |

9. එක්තරා භාණ්ඩයක් සඳහා ඇති වෙළෙඳපොළ ඉල්ලුම් වක්‍රය පහත රූප සටහනෙහි දැක් වේ. ඉහත රූප සටහනෙහි දැක්වෙන ඉල්ලුම් වක්‍රය රු. 8 සහ රු. 10 අතර මිලයන්හි දී




(1) පූර්ණ නම්‍ය වේ.

(2) සාපේක්ෂව නම්‍ය වේ.

(3) සාපේක්ෂව අනම්‍ය වේ.

(4) ඒ කීය නම්‍ය වේ.

(5) පූර්ණ අනම්‍ය වේ.

Econvideoclz.lk

10. තරගකාරී වෙළෙඳ පොළක අලෙවිකරන එක්තරා භාණ්ඩයක් සඳහා ඇති ඉල්ලුම් හා සැපයුම් වක්‍ර පහත දැක්වෙන සමීකරණ මගින් නිරූපණය කෙරේ. මිල රුපියල් වලින් දැක් වේ.

ඉල්ලුම : QD = 40 - 2P සැපයුම : Qs = - 40 + 8P

වෙළෙඳපොළ සමතුලිතයේ දී සමස්ත අතිරික්තය

(1) 36කි. (2) 144 කි. (3) 180කි. (4) 192කි. (5) 360කි.

11. සහල් සහ පාන් අතර ඉල්ලුමේ හරස් මිල නම්‍යතාව 3.0 ක් වේ යැයි සලකන්න. සහල් මිල ඉහළ යාමක් නිසා පාන් ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය 75%කින් වැඩි විය. සහල් මිලයන්හි කවර වෙනසක් මේ සඳහා හේතු වූයේ ද?

| සහල් කිලෝග්‍රෑමයක මිල වෙනස් වීම (රු.) | | |
|---|---|---|
| | සිට | දක්වා |
| (1) | 50 | 70 |
| (2) | 60 | 72 |
| (3) | 75 | 90 |
| (4) | 80 | 105 |
| (5) | 100 | 125 |

12. තිරිඟු පිටි සඳහා වෙළෙඳපොළ සමතුලිත මිල කිලෝග්‍රෑමයක් රු. 350 ක් වන අතර වෙළෙඳපොළ සමතුලිත ප්‍රමාණය කිලෝග්‍රෑම් මිලියන 30කි. මෙම තත්ත්වය යටතේ පහත සඳහන් කවර ප්‍රතිපත්තියක් වෙළෙපොළේ තිරිඟු පිටි සඳහා අධි ඉල්ලුම් තත්ත්වයක් ඇති කරනු ලැබේ ද?

(1) කිලෝග්‍රෑමයක් රු. 330 ලෙස උපරිම මිලක් පැනවීම

(2) කිලෝග්‍රෑමයක් රු. 330 ලෙස අවම මිලක් පැනවීම

(3) කිලෝග්‍රෑමයක් රු. 400 ලෙස උපරිම මිලක් පැනවීම

(4) කිලෝග්‍රෑමයක් රු. 350 ලෙස අවම මිලක් පැනවීම

(5) කිලෝග්‍රෑමයක් රු. 375 ලෙස උපරිම මිලක් පැනවීම

13. පහළට බෑවුම් වන ඉල්ලුම් වක්‍රයක් සහ ඉහළට බෑවුම් වන සැපයුම් වක්‍රයක් සහිත භාණ්ඩයක් මත පනවනු ලබන ඒකක බද්දක්

(1) නිෂ්පාදක අතිරික්තය ඉහළ නංවයි.


(2) පාරිභෝගික අතිරික්තය ඉහළ නංවයි.

(3) සැපයුම් වක්‍රය දකුණට විතැන් කිරීමට හේතු වේ.

(4) බද්දේ ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයකින් මිල ඉහළ නංවයි.

(5) බද්දේ ප්‍රමාණයට වඩා අඩු ප්‍රමාණයකින් මිල ඉහළ නංවයි.

14.




බඩ ඉරිඟු සඳහා වෙළෙඳ පොළ ඉල්ලුම් සහ සැපයුම් වක්‍ර ඉහත රූප සටහන පෙන්නුම් කරයි. බඩ ඉරිඟු ගොවීන්ට උපකාර වශයෙන් සඵල අවම මිලක් හඳුන්වා දීමට රජය අදහස් කරන්නේ යැයි සලකන්න. සඵල අවම මිල වශයෙන් $0P_2$ පවත්වා ගෙනයාමට රජය කළ යුත්තේ කුමක්ද?

(1) $Q_1$ - $Q_2$ ප්‍රමාණය මිලට ගැනීම

(2) 0 - $Q_2$ ප්‍රමාණය මිලට ගැනීම

(3) $Q_1$ - $Q_3$ ප්‍රමාණය මිලට ගැනීම

(4) $Q_2$ - $Q_3$ ප්‍රමාණය මිලට ගැනීම

(5) $Q_1$ - $Q_2$ ප්‍රමාණය අලෙවි කිරීම

Econvideoclz.lk

15. විචල්‍ය යෙදවුම වශයෙන් ශ්‍රමය පමණක් යොදා ගැනෙන නිෂ්පාදන ක්‍රියාවලියක් උපකල්පනය කරන්න. නිමැවුම ඉහළ යන විට මෙම ආයතනයේ කෙටි කාලීන ආන්තික පිරිවැය වැඩි වෙමින් පවතී නම් පහත සඳහන් කවරක් සත්‍යවේද?

(1) ශ්‍රමයේ සාමාන්‍ය ඵලදාව ස්ථාවරව පවතී.

(2) ශ්‍රමයේ සාමාන්‍ය ඵලදාව වැඩි වෙමින් පවතී.

(3) ශ්‍රමයේ සාමාන්‍ය ඵලදාවට වඩා ආන්තික ඵලදාව විශාලය.

(4) ශ්‍රමයේ ආන්තික ඵලදාව අඩු වෙමින් පවතී.

(5) ශ්‍රමයේ මුළු ඵලදාව අඩු වෙමින් පවතී.

16. ආර්ථික ලාභය ගණනය කළ හැකි වනුයේ ගිණුම්කරණ ලාභයෙන් පහත සඳහන් කවරක් අඩු කළ විට දී ද?

(1) ස්ථාවර පිරිවැය (2) ආරෝපිත පිරිවැය (3) ක්ෂයවීම්

(4) ඍජු පිරිවැය (5) මුළු පිරිවැය

17. කෙටි කාලයේ දී නිමැවුම වැඩිකරන විට අඛණ්ඩව පහළ බැසිය යුත්තේ පහත සඳහන් කවර පිරිවැයක්ද?

(1) මුළු විචල්‍ය පිරිවැය (2) මුළු ස්ථාවර පිරිවැය (3) සාමාන්‍ය විචල්‍ය පිරිවැය

(4) සාමාන්‍ය ස්ථාවර පිරිවැය (5) සාමාන්‍ය මුළු පිරිවැය

18. තරගකාරී නිෂ්පාදන ආයතනයක පවත්නා නිමැවුම් මට්ටමේ දී ආන්තික පිරිවැය රු. 100ක් ද, සාමාන්‍ය විචල්‍ය පිරිවැය රු. 60ක් ද, සාමාන්‍ය ස්ථාවර පිරිවැය රු. 40ක් ද වන අතර නිෂ්පාදිතයේ මිල ඒකකයක් රු. 100ක් වේ. එම ආයතනය සඳහා පහත සඳහන් කවර ප්‍රකාශයක් සත්‍ය වේද?

(1) මිල සාමාන්‍ය මුළු පිරිවැයට සමාන වන බැවින් ආර්ථික ලාභ ශුන්‍ය වේ.

(2) මුළු අයභාරය මුළු පිරිවැයට වඩා අඩු බැවින් ආර්ථික ලාභ ඍණ අගයක් ගනී.

(3) මුළු අයභාරය මුළු පිරිවැයට වඩා වැඩි බැවින් ආර්ථික ලාභ ධන අගයක් ගනී.

(4) මිල සාමාන්‍ය විචල්‍ය පිරිවැයට වඩා වැඩි බැවින් ආර්ථික ලාභ ඍණ අගයක් ගනී.

(5) ආන්තික පිරිවැය ආන්තික අයභාරයට සමාන වන බැවින් ආර්ථික ලාභ ශුන්‍ය වේ.

19. නියමානුකූල ව්‍යාපාර චක්‍රයක නිවැරදි අනුපිළිවෙළ විස්තර කෙරෙනුයේ පහත සඳහන් කවරකින්ද?

(1) ප්‍රසාරණය, වෘද්ධිය, මුදුනත සහ ප්‍රතිගමනය ( පසුබෑම)

(2) ප්‍රසාරණය, මුදුනත, ප්‍රතිගමනය සහ පතුළ

(3) මුදුනත, ප්‍රසාරණය, පතුළ සහ ප්‍රතිගමනය

(4) ප්‍රසාරණය, ප්‍රකෘති තත්ත්වයට පත්වීම (recovery), පතුළ සහ මුදුනත

(5) පතුළ මුදුනත, ප්‍රතිගමනය සහ ප්‍රසාරණය

20. දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීමේ දී පරිභෝජන වියදමක් (C) ලෙස වර්ගීකරණය කෙරෙනුයේ පහත සඳහන් කවරක්ද?

(1) පාන් සෑදීම සඳහා බේකරිකරුවෙක් තිරිඟු පිටි මිල දී ගැනීම

(2) බලශක්ති අමාත්‍යාංශය සඳහා අලුත් පරිගණක මෘදුකාංගයක් මිල දී ගැනීම

(3) පාවිච්චි කළ ඇඳුම් පුණ්‍යායතනයකට පරිත්‍යාග කිරීම

(4) පොදු සමාගමක කොටස් 1 000ක් මිල දී ගැනීම

(5) ආපන ශාලාවකින් රාත්‍රී ආහාර ලබා ගැනීම සඳහා රු. 3 000ක් වැයකිරීම

Econvideoclz.lk

21. ධනවත් පුද්ගලයෙකු තම නිවාඩුව ගත කිරීම සඳහා සෑම වර්ෂයකදීම කුලියට ගත් නුවර එළියේ පිහිටි නිවාඩු නිකේතනය ඔහු/ඇය විසින් මිල දී ගනු ලැබුවේ යැයි සලකන්න. මෙම ගනුදෙනුව නිසා

(1) පරිභෝජන වියදම (C) අඩුවන බැවින් නිවාඩු නිකේතනය මිල දී ගත් මුදල් ප්‍රමාණයෙන් දළ දේශීය නිෂ්පාදිතය පහළ වැටේ.

(2) නිවාඩු නිකේතනය මිල දී ගත් මුදල් ප්‍රමාණයෙන් ආයෝජන (I) වැඩිවන බැවින් දළ දේශීය නිෂ්පාදිතය ඉහළ නගී.

(3) පාවිච්චි කළ දෑ යළි අලෙවි කිරීමක් සිදුවන බැවින් දළ දේශීය නිෂ්පාදිතයට බලපෑමක් ඇති නොවේ.

(4) ආයෝජනය (I) අඩු වන බැවින් දළ දේශීය නිෂ්පාදිතය පහළ වැටේ.

(5) ආයෝජනය (I) ඉහළ ගිය නමුත් පරිභෝජනය (C) පහළ වැටේ.

22. දෙන ලද වර්ෂයක නාමික දළ දේශීය නිෂ්පාදිතය රු. බිලියන 1 200ක් ද, මූර්ත දළ දේශීය නිෂ්පාදිතය රු. බිලියන 1 000 ක් ද වේ නම්, දළ දේශීය නිෂ්පාදිතයේ අවධමනකය වනුයේ

(1) 12%. (2) 20%. (3) 83.3කි. (4) 120කි. (5) 200කි.

23. එක්තරා ආර්ථිකයකට අදාළ සාර්ව ආර්ථික දත්ත කිහිපයක් පහත වගුවෙහි දැක්වේ.

| අයිතමය | වටිනාකම (රු. බිලියන) |
|---|---|
| දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය | 50 |
| භාණ්ඩ සහ සාධක නොවන සේවා අපනයනය | 10 |
| භාණ්ඩ සහ සාධක නොවන සේවා ආනයනය | 16 |
| ආණ්ඩුවේ ඉතුරුම් | -3 |

මෙම ආර්ථිකයේ පෞද්ගලික ඉතුරුම්වල අගය

(1) රු. බිලියන 47කි.

(2) රු. බිලියන 44කි.

(3) රු. බිලියන 41කි.

(4) රු. බිලියන 34කි.

(5) රු. බිලියන 31කි.

24. එක්තරා ආර්ථිකයක සමාහාර ආදායම රු. මිලියන 500 සිට රු. මිලියන 1 000 ක් දක්වා වැඩි වන විට, සමාහාර පරිභෝජන වියදම රු. මිලියන 800 සිට රු. මිලියන 1 200 ක් දක්වා වැඩි වේ යැයි සලකන්න. මෙම ආර්ථිකයේ ස්වායත්ත පරිභෝජනයේ සහ ආන්තික පරිභෝජන නැඹියාවේ අගයන් වනුයේ,

| | ස්වායත්ත පරිභෝජනය (රු. මිලියන) | ආන්තික පරිභෝජන නැඹියාව |
|---|---|---|
| (1) | 500 | 1.5 |
| (2) | 400 | 0.8 |
| (3) | 300 | 0.2 |
| (4) | 200 | 0.1 |
| (5) | 100 | 0.8 |

25. කිසියම් ආර්ථිකයක ආන්තික පරිභෝජන නැඹියාව 0.8ක් බවත්, සමතුලිත මූර්ත දළ දේශීය නිෂ්පාදිතය පූර්ණ සේවා නියුක්ති මූර්ත දළ දේශීය නිෂ්පාදිතයට වඩා රු. බිලියන 1 000කින් අඩු බවත් උපකල්පනය කරන්න. ආර්ථිකයේ මූර්ත දළ දේශීය නිෂ්පාදිතය පූර්ණ සේවා නියුක්ති ආදායම් මට්ටම කරා ළඟා කරවීම සඳහා ආණ්ඩුවේ මිල දී ගැනීම කොතරම් ප්‍රමාණයකින් වැඩි කළ යුතු වේද?

(1) රු. බිලියන 150

(2) රු. බිලියන 200

(3) රු. බිලියන 250

(4) රු. බිලියන 300

(5) රු. බිලියන 350

Econvideoclz.lk

26. ආර්ථිකයක ආන්තික පරිභෝජන නැඹියාව වැය කළ හැකි ජාතික ආදායමෙන් 0.8ක් වන බවත් රජය 25%ක ස්ථාවර ප්‍රතිශතයක් යටතේ සියලු ආදායම් වලින් බදු අය කරගනු ලබන බවත් උපකල්පනය කරන්න. මෙම ආර්ථිකයේ දළ ජාතික ආදායම රු. බිලියන 200කින් ඉහළ නගී නම් පරිභෝජනය ආරම්භක වශයෙන් වැඩි වනුයේ

(1) රු. බිලියන 50කිනි. (2) රු. බිලියන 120කිනි (3) රු. බිලියන 150කිනි
(4) රු. බිලියන 160කිනි. (5) රු. බිලියන 750කිනි.

.

27. භාගික සංචිත ක්‍රමය පදනම කරගත් බැංකු පද්ධතියක් සහිත ආර්ථිකයක සංචිත අනුපාතය 10%ක් ව තිබිය දී රු. මිලියන 50 ක නව තැන්පතුවක් නිසා තැන්පතු ගුණකයට අනුව හටගන්නා මුළු තැන්පතු ප්‍රමාණය කොපමණ ද?

(1) රු. මිලියන 500 (2) රු. මිලියන 450 (3) රු. මිලියන 400
(4) රු. මිලියන 350 (5) රු. මිලියන 50

28. මුදල් සැපයුම පිළිබඳ $M_2$ නිර්වචනයට ඇතුළත් නොවනුයේ පහත සඳහන් කවරක්ද?

(1) මහජනයා සතු ව්‍යවහාර මුදල්
(2) මහජනයා සතු ඉල්ලුම් තැන්පතු
(3) මහජනයා සතු ඉතුරුම් තැන්පතු
(4)මහජනයා සතු කාලීන තැන්පතු
(5) මහජනයා සතු ණයපත් (credit cards)

29. විනිමය සමීකරණය පදනම් කරගනිමින් Y = 500, M = 400 සහ V = 5 වේ නම් P =

(1) 1/4 (2) 4 (3) 6.25 (4) 80 (5) 100

30. පහත දැක්වෙන ප්‍රතිපත්ති අතුරින් උද්ධමනීය පරතරයක් පියවීමට සමත් වන්නේ කවරක්ද?

(1) සංචිත අවශ්‍යතා පහළ හෙළීම සහ අයවැය පරතරය ඉහළ නැංවීම
(2) සංචිත අවශ්‍යතා ඉහළ නැංවීම සහ වට්ටම් අනුපාතිකය පහළ හෙළීම
(3) මුදල් සැපයුම වැඩි කිරීම, රජයේ වියදම අඩු කිරීම සහ බදු අඩු කිරීම
(4) මුදල් සැපයුම අඩු කිරීම, බදු ඉහළ නැංවීම සහ රජයේ වියදම් අඩු කිරීම
(5) මුදල් සැපයුම අඩු කිරීම, බදු අඩු කිරීම සහ රජයේ වියදම් අඩු කිරීම

31. මුදල් සැපයුමෙහි වැඩි වීමකට හේතු වනුයේ පහත සඳහන් කවරක්ද?

(1) ආදායම් බදු අනුපාතිකයන්හි පහළ බැසීමක්
(2) ආණ්ඩුවේ අයවැය හිඟයේ අඩු වීමක්
(3) මහ බැංකුව විසින් විවෘත වෙළෙඳ පොළෙන් සුරැකුම්පත් මිල දී ගැනීම
(4) භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කරමින් රජය ලබා ගන්නා ණය ඉහළ යාමක්
(5) ප්‍රතිපත්ති පොලී අනුපාතික ඉහළ යාමක්

32. පොදු භාණ්ඩයක් සම්බන්ධයෙන් පහත සඳහන් කවරක් සත්‍ය වේද?

(1) එක් පුද්ගලයෙකුගේ පරිභෝජනය නිසා සෙසු අයට ලැබෙන ප්‍රමාණය අඩු වේ.
(2) ඒ සඳහා ගෙවීමක් නොකරන පාරිභෝගිකයන් ඉන් ප්‍රතිලාභ ලබා ගැනීමෙන් බැහැර කළ හැකි වේ.
(3) පොදු භාණ්ඩයක වැඩිපුර ඒකකයක් ඇතැම් පාරිභෝගිකයන්ට ලැබෙන විට සෙසු පාරිභෝගිකයන්ට ලැබෙන ප්‍රමාණය එම ප්‍රමාණයෙන් ම අඩු වේ.
(4) එක් පුද්ගලයෙකුගේ පරිභෝජනය සෙසු අය එම භාණ්ඩය පරිභෝජනය කිරීමෙන් බැහැර නොකරයි.
(5) සැම දෙනාම භාණ්ඩය සඳහා සමාන මිලක් ගෙවති.

Econvideoclz.lk

33. කිසියම් භාණ්ඩයක් නිෂ්පාදනය කරන විට ධන බාහිරතා හටගනී නම්, පහත සඳහන් කවරක් සත්‍ය වේ ද?

(1) රජය විසින් එම භාණ්ඩය නිෂ්පාදනය නොකළ යුතු ය.

(2) පෞද්ගලික අංශයේ නිෂ්පාදනය සමාජයීය වශයෙන් හිතකර මට්ටමට වඩා පහළින් පවතී.

(3) එම භාණ්ඩයේ වෙළෙඳපොළ මිල ඉතා ඉහළ අගයක් ගනු ඇත.

(4) එම භාණ්ඩය නිෂ්පාදනය කිරීම රජය විසින් අධෛර්යමත් කළ යුතු ය.

(5) එම භාණ්ඩය නිෂ්පාදනය කිරීමෙන් පෞද්ගලික ආයතන වලට ලාභ උපරිම කිරීමට නොහැකි වනු ඇත.

34. තෙරපුම් ප්‍රතිවිපාකයෙන් විස්තර කෙරෙනුයේ පහත සඳහන් කවරක්ද?

(1) අයවැය හිඟය මූල්‍යනය සඳහා ණය ලබාගන්නා විට රජය පෞද්ගලික ණය ගනුවන් සමග තරග කිරීමේ දී පොලී අනුපාතික ඉහළ යාම හේතුවෙන් පෞද්ගලික ආයෝජනය පහළ වැටේ.

(2) රජය පොලී අනුපාතික ඉහළ නොදමා මුදල් සැපයුම වැඩි කරන විට උද්ධමන අනුපාතිකය සහ පෞද්ගලික ආයෝජන වැඩි වේ.

(3) ව්‍යාපාරික ආයතන ආයෝජන ව්‍යාපෘති සඳහා තරග කරන විට ඉතා දුබල සමාගම් තරගයේ තෙරපුමට ලක් වීමෙන් ව්‍යාපාරික බිඳ වැටීම් හටගනී.

(4) රජය මුදල් වෙළෙඳපොළෙන් බැඳුම්කර නැවත මිලට ගන්නා විට මුදල් සැපයුම අඩුවන අතර පෞද්ගලික ආයෝජකයන්ට ණය ලබා ගැනීම සඳහා තරග කිරීමට සිදු වේ.

(5) ව්‍යාපාරික අංශය මුදල් ණයට ගන්නා විට රජය සමග තරග කරන අතර එහි දී පොලී අනුපාතික පහළ වැටීම නිසා පෞද්ගලික ආයෝජනය ඉහළ නගී.

35. වෙළෙඳ පොළ අසමත් වීම් හටගනුයේ

(1) නිෂ්පාදන ආයතන වලට අඛණ්ඩව විශාල අලාභ දැරීමට සිදුවන විට දීය.

(2) නිෂ්පාදන ආයතන වලට තම නිෂ්පාදිත සඳහා වෙළෙඳ පොළ සොයා ගැනීමට නොහැකි වන විට දී ය.

(3) ඉල්ලුම පහළ වැටීම නිසා ඔවුන්ගේ නිෂ්පාදනය කපා හැරීමට නිෂ්පාදන ආයතන වලට සිදුවන විට දීය.

(4) මිල ඉහළ යාම නිසා තම අවශ්‍යතා සපුරා ගැනීමට පාරිභෝගිකයන්ට දුෂ්කරවන විට දී ය.

(5) මිල යන්ත්‍රණය විසින් සම්පත් කාර්යක්ෂමව බෙදා වෙන් නොකරන විට දීය.

36. 2020 වර්ෂයේ දී ශ්‍රී ලංකා රජයේ පුනරාවර්තන වියදමේ විශාලත ම අයිතමය වූයේ

(1) වැටුප් සහ වේතනයි. (2) රජයේ වර්තන පැවරුම සහ සහනාධාරයි.

(3) විශ්‍රාම වැටුප් ය. (4) පොලී ගෙවීම් ය.

(5) පොහොර සහනාධාරයි.

37. වර්තමාන ශ්‍රී ලංකාවේ ප්‍රධාන ද්විපාර්ශ්වීය ණය හිමියන් වනුයේ

(1) චීනය, ඉන්දියාව සහ සවුදි අරාබියයි.

(2) චීනය, ඉන්දියාව සහ ජපානයයි.

(3) චීනය, ඉන්දියාව සහ ලෝක බැංකුවයි.

(4) චීනය, ඉන්දියාව සහ ජර්මනියයි.

(5) චීනය, ජපානය සහ බංග්ලාදේශයයි.

Econvideoclz.lk

38. ශ්‍රී ලංකාවේ සහ ඉන්දියාවේ පාපැදියක් සහ ත්‍රිරෝද රථයක් නිපදවීමට අවශ්‍ය කරන ශ්‍රම පැය සංඛ්‍යාව පහත වගුවේ පෙන්නුම් කරයි.

| රට | පාපැදි | ත්‍රිරෝද රථ |
|---|---|---|
| ඉන්දියාව | 15 | 60 |
| ශ්‍රී ලංකාව | 20 | 120 |

මෙම තොරතුරු වලට අනුව සත්‍ය ප්‍රකාශය කවරක්ද?

(1) ශ්‍රී ලංකාවට භාණ්ඩ දෙක ම සම්බන්ධයෙන් නිරපේක්ෂ වාසියක් පවතී.

(2) ඉන්දියාව පාපැදි පිළිබඳ විශේෂ ප්‍රාගුණ්‍යනය කළ යුතු අතර ශ්‍රී ලංකාව ත්‍රිරෝද රථ පිළිබඳ විශේෂ ප්‍රාගුණ්‍යනය කළ යුතු ය.

(3) ඉන්දියාවට ත්‍රිරෝද රථ සඳහා සාපේක්ෂ වාසියක් පවතී.

(4) ශ්‍රී ලංකාවට ත්‍රිරෝද රථ සඳහා නිරපේක්ෂ වාසියක් පවතී.

(5) ඉන්දියාවට පාපැදි සහ ත්‍රිරෝද රථ යන භාණ්ඩ දෙක ම නිෂ්පාදනය සඳහා සාපේක්ෂ වාසි ඇත.

39. කිසිදු තීරු බද්දක් නොමැති තත්ත්වයක් යටතේ දේශීය පාපැදි නිෂ්පාදකයෙක් රු. 15 000 ක් වටිනා ආනයන යෙදවුම භාවිත කරමින් නිෂ්පාදනය කරනු ලබන පාපැදියක් රු. 25 000කට අලෙවි කරනවා යැයි සලකන්න. රජය පාපැදි මත 20%ක තීරු බද්දක් පනවනු ලැබුවහොත් ආනයනය කරන ලද පාපැදියක් දැන් අලෙවි කෙරෙනුයේ රු. 30 000 කට ය. මෙම තත්ත්වය යටතේ දේශීය වශයෙන් නිෂ්පාදනය කෙරෙන පාපැදි සඳහා ලැබෙන සඵල ආරක්ෂණ අනුපාතිකය කොපමණ ද?

(1) 20% (2) 25% (3) 40% (4) 45% (5) 50%

40. වර්තමානයේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන කාර්මික අපනයන අයිතම තුන වනුයේ

(1) (අ) රෙදිපිළි සහ ඇඟලුම් (ආ) ආහාර පාන සහ දුම්කොළ (ඉ) මැණික්, දියමන්ති සහ ස්වර්ණාභරණ වේ.

(2) (අ) රෙදිපිළි සහ ඇඟලුම් (ආ) රබර් නිෂ්පාදිත (ඉ) මැණික්, දියමන්ති සහ ස්වර්ණාභරණ වේ.

(3) (අ) රෙදිපිළි සහ ඇඟලුම් (ආ) රබර් නිෂ්පාදිත (ඉ) ආහාර පාන සහ දුම්කොළ වේ.

(4) (අ) ඛනිජ තෙල් නිෂ්පාදිත (ආ) රබර් නිෂ්පාදිත (ඉ) ආහාර පාන සහ දුම්කොළ වේ.

(5) (අ) ඛනිජ තෙල් නිෂ්පාදිත (ආ) රබර් නිෂ්පාදිත (ඉ) මැණික්, දියමන්ති සහ ස්වර්ණාභරණ වේ.

41. ආර්ථිකයක භාණ්ඩ වෙළෙඳ අනුපාත දර්ශකය පදනම් වර්ෂයේ පැවැති 100 සිට 80 දක්වා පහළ ගියේ යැයි සලකන්න. මෙයට හේතු වී ඇත්තේ අපනයන මිල දර්ශකයේ සහ ආනයන මිල දර්ශකයේ කවර වෙනස් වීමක් ද?

| | අපනයනය මිල දර්ශකයේ වෙනස් වීම | ආනයන මිල දර්ශකයේ වෙනස් වීම |
|---|---|---|
| (1) | + 20 | 0 |
| (2) | 40 | + 20 |
| (3) | - 10 | + 20 |
| (4) | 12 | + 10 |
| (5) | 4 | - 20 |

42. ඕස්ට්‍රේලියානු රජය ඩොලර් මිලියන 50 ක් වටිනා ආහාර සහ ඖෂධ ශ්‍රී ලංකා රජයට පරිත්‍යාග කරන ලදී. ද්විත්ව සටහන් මූල ධර්මයට අනුව ශ්‍රී ලංකාවේ ගෙවුම් ශේෂ ගිණුමෙහි මෙම ප්‍රදානය සටහන් වන්නේ කෙසේද ?

| | බැර | හර |
|---|---|---|
| (1) | භාණ්ඩ හා සේවා : භාණ්ඩ | ද්විතියික ආදායම් : රජය |
| (2) | ද්විතියික ආදායම් : රජය | භාණ්ඩ හා සේවා : භාණ්ඩ |
| (3) | භාණ්ඩ හා සේවා : සේවා | මූල්‍ය ගිණුම : වෙනත් ආයෝජන |
| (4) | භාණ්ඩ හා සේවා : භාණ්ඩ | ප්‍රාග්ධන ගිණුම : සංක්‍රාම |
| (5) | ද්විතියික ආදායම් : රජය | මූල්‍ය ගිණුම : විවිධ ආයෝජන |

Econvideoclz.lk

43. නම්‍ය විනිමය අනුපාතික ක්‍රමයක් යටතේ දේශීය භාණ්ඩ සඳහා විදේශීය ඉල්ලුම ඉහළ යාමක්

(1) දේශීය ව්‍යවහාර මුදල සඳහා ඉල්ලුම වැඩි කොට දේශීය ව්‍යවහාර මුදලේ අගය ක්ෂයවීමක් ඇති කරයි.

(2) දේශීය ව්‍යවහාර මුදල සඳහා ඉල්ලුම අඩු කොට දේශීය ව්‍යවහාර මුදලේ අගය ඉහළ යාමක් ඇති කරයි.

(3) දේශීය ව්‍යවහාර මුදල සඳහා ඉල්ලුම වැඩි කොට දේශීය ව්‍යවහාර මුදලේ අගය ඉහළ යාමක් ඇති කරයි.

(4) දේශීය ව්‍යවහාර මුදල සඳහා ඉල්ලුම අඩු කොට දේශීය ව්‍යවහාර මුදලේ අගය ක්ෂයවීමක් ඇති කරයි.

(5) දේශීය ව්‍යවහාර මුදලේ සැපයුම අඩු කොට දේශීය ව්‍යවහාර මුදලේ අගය ක්ෂය වීමක් ඇති කරයි.

44. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ප්‍රධාන කාර්යභාරය කුමක්ද?

(1) ස්ථායි විනිමය අනුපාතික තන්ත්‍රයක් සහතික කරලීම සහ ගෙවුම් ශේෂ අර්බුද වලට මුහුණ දෙන රට වලට හදිසි මූල්‍ය ආධාර සැපයීම

(2) ගෙවුම් ශේෂ සමතුලිතතාව සහ ජාත්‍යන්තර වෙළෙඳාමේ තුලිත සංවර්ධනයක් සහතික කරලීම සඳහා දිගු කාලීන ප්‍රාග්ධන ආයෝජන ලබාදීම

(3) ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කොට දරිද්‍රතාව පහළ දැමීම සඳහා සාමාජික රටවලට ණය මුදල් ලබාදීම

(4) සෘජු විදේශ ආයෝජන නිදහසේ ගලා ඒමට පවත්නා බාධක ඉවත් කරලීම

(5) සාමාජික රටවල ආර්ථික සංවර්ධනය සහ ප්‍රතිසංස්කරණය සඳහා දිගු කාලීන මූල්‍ය පහසුකම් සැපයීම

45. පහත සඳහන් කවරක් ආර්ථික වෘද්ධිය අඩු කිරීමට හේතු වේ ද?

(1) ආයෝජනයේ පහළ යාමක්

(2) විදේශ වල සිට පැමිණෙන ආගමනිකයන් සංඛ්‍යාවේ ඉහළයාමක්

(3) තාක්ෂණික දියුණුවක්

(4) ශ්‍රම හමුදාවේ ඉහළ යාමක්

(5) ඉතුරුම් අනුපාතිකයේ ඉහළ යාමක්

46. සංවර්ධනය යනු

(1) දළ ජාතික ආදායමේ තිරසාර වැඩිවීමකි.

(2) ග්‍රාමීය ජනතාවගේ ආදායම් විෂමතා ඉවත් කරලීම ය.

(3) ආර්ථික ව්‍යුහයේ වෙනස්කම් සමග ආර්ථික වෘද්ධිය හටගැනීම ය.

(4) රටක මූර්ත දළ දේශීය නිෂ්පාදිතය ඉහළ යාම ය.

(5) සාමාන්‍ය පුරවැසියාගේ ජීවිතයේ ගුණාත්මක තත්ත්වය උසස් වීම ය.

47. රටක ආදායම් ව්‍යාප්තිය වඩාත් සාධාරණීය කිරීමෙහි ලා බොහෝ දුරට හැකියාව ඇත්තේ පහත සඳහන් කවර ප්‍රතිපත්තියකටද?

(1) ආහාර හා රෙදිපිළි මත පොදු අලෙවි බද්දක් ඇති කරලීම

(2) අනුක්‍රම ආදායම් බදු පද්ධතියක් ස්ථාපිත කිරීම

(3) සුඛෝපභෝගී භාණ්ඩ මත පනවනු ලබන දේශීය භාණ්ඩ බදු ඉවත් කරලීම

(4) සියලුම ආදායම් කාණ්ඩ සඳහා බදු අනුපාතික සමානුපාතිකව පහළ දැමීම

(5) අධ්‍යාපනය සහ සෞඛ්‍යය සඳහා ලබාදෙන සහනාධාර අඩු කිරීම

48. ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ දත්ත වලට අනුව 2019 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ ජාතික ජනගහන දරිද්‍රතා දර්ශකයත්, වැඩිම ජනගහන දරිද්‍රතා දර්ශකය සහිත දිස්ත්‍රික්කයත් නිවැරදි ව දැක්වෙනුයේ පහත සඳහන් කවර සංයෝජනයකින්ද?

| | ජාතික ජනගහන දරිද්‍රතා දර්ශකය (%) | වැඩිම ජනගහන දරිද්‍රතා දර්ශකය සහිත දිස්ත්‍රික්කය |
|---|---|---|
| (1) | 3.2 | නුවරඑළිය |
| (2) | 4.1 | මුලතිව් |
| (3) | 14.3 | මුලතිව් |
| (4) | 14.3 | කිලිනොච්චිය |
| (5) | 16.0 | බදුල්ල |

Econvideoclz.lk

49. රටක ශ්‍රම හමුදා සහභාගීත්ව අනුපාතිකය ගණනය කිරීම සඳහා පහත සඳහන් කවරක් නිවැරදි වේද?

(1) $\frac{\text{සේවා නියුක්ත ජනගහනය - සේවා වියුක්ත ජනගහනය}}{\text{වැඩ කරන වයසේ ජනගහනය}} \times 100$

(2) $\frac{\text{සේවා නියුක්ත ජනගහනය + සේවා වියුක්ත ජනගහනය}}{\text{වැඩ කරන වයසේ ජනගහනය}} \times 100$

(3) $\frac{\text{වැඩ කරන වයසේ ජනගහනය - සේවා නියුක්ත ජනගහනය}}{\text{ආර්ථික වශයෙන් සක්‍රීය ජනගහනය}} \times 100$

(4) $\frac{\text{වැඩ කරන වයසේ ජනගහනය - සේවා නියුක්ත ජනගහනය}}{\text{මුළු ජනගහනය}} \times 100$

(5) $\frac{\text{ආර්ථික වශයෙන් සක්‍රීය ජනගහනය}}{\text{මුළු ජනගහනය}} \times 100$

50. ශ්‍රී ලංකාව මීට ඉහත ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වැඩසටහන් දහසයකට සම්බන්ධ වී සිටිය ද, එම වැඩසටහන් බොහෝමයක් සාර්ථකව ක්‍රියාවට නැගීමට බලයේ සිටි රජයන් අසමත් වූයේ ප්‍රධාන වශයෙන්

(1) එවැනි වැඩසටහන්වලට අදාළ එකඟ වූ ප්‍රතිසංස්කරණ කොන්දේසි සපුරාලීමේ දී ප්‍රමාණවත් කැපවීමක් නොදැක්වූ බැවිනි.

(2) ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙළෙඳපොළවලින් අවශ්‍ය තරම් අරමුදල් සපයාගත හැකි වූ බැවිනි.

(3) විදේශ විනිමය හිඟය යටපත් කර ගැනීම සඳහා ව්‍යවහාර මුදල් හුවමාරු ගිවිසුම මත දැඩිව රඳා සිටි බැවිනි.

(4) ඍජු විදේශ ආයෝජන සුමට ලෙස ගලා ආ බැවින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහාය අවශ්‍ය නො වූ බැවිනි.

(5) නම්‍යශීලී විදේශ විනිමය අනුපාතික ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමේ ප්‍රතිඵල වශයෙන් රටේ විදේශ සංචිත සැලකිය යුතු අන්දමින් ඉහළ ගොස් තිබූ බැවිනි.

Econvideoclz.lk